# උඩරට කැරැල්ල ආශ්‍රිත ජනශ්‍රැති හා සාහිත්‍යමය නිර්මාණ පිළිබඳ කේන්ද්‍රීය චරිත හා සිදුවීම් කීපයක් ඇසුරෙන් කෙරෙන සංක්ෂිප්ත විමර්ශනයක්

නන්දන මිල්ලගල ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

## ප්‍රවේශය

කැරැල්ල, සටන, අරගලය, ගැටුම, යුද්ධය ආදී ව්‍යවහාරයන් සමාන්තර වාචී ලෙස පෙනුණ ද ඒවා එකිනෙකට වෙනස් වූ මානව ක්‍රියාදාමයන්ය. එහෙත් මේ ක්‍රියාදාමවල පවත්නා එක් පොදු ස්වභාවයක් වන්නේ පාර්ශව දෙකක් අතර, ඔවුනොවුන් පිළිගත් අරමුණුවලට ළඟාවීම වෙනුවෙන්, විවිධ ශක්තීන් උරගා බැලීමකි. මිනිස් ඉතිහාසය පුරාම අරගල, ගැටුම්, සටන්, කැරලි මෙන්ම යුද්ධ ද නොඅඩුව හමුවේ. එක්තරා ආකාරයකට ඒවා මානව පරිණාමයේම අංග ලෙස ද විග්‍රහ කළ හැකිය. එබැවින් සමාජ පරිවර්තනයන් කෙරෙහි මෙවැනි මානව ක්‍රියාකාරකම් උපයුක්ත වී තිබේ. ගණ ගෝත්‍රික සමාජවල සිටම එවැනි භාවිතයන් පැවතී ඇත. දේශසීමා වෙන්කර ගැනීම, ඉඩම් අයිතිය, රාජ්‍ය අයිතිය, පොදු දේපළ අයිතිය, නිදහස හා ඇතැම් කුල - ගෝත්‍ර, ආගම්, වර්ණාදී අනන්‍යතා දිනා ගැනීමට මිනිසා ඉතිහාසයේ සටන් වැද තිබේ. එයින් තම කායික ශක්තිය, ආයුධ බලය හෝ වෙනත් උපායමාර්ගික ක්‍රම මගින් එක් පාර්ශවයක් ඉදිරියට පැමිණෙන විට තවත් කණ්ඩායමක් විනාශ වීම, අඩපණ වීම හෝ යටත් වීම සිදුවේ. පසුව කණ්ඩායමක් ඉදිරියට පැමිණීම හෝ ජයග්‍රාහී වූ බව ප්‍රකට කරන්නේ ස්වකීය අරමුණු වෙත ළඟා වූ බව තහවුරු කරමිනි. මෙම පූර්විකාව මෙරට ඉතිහාසයේ ඇති වූ ''උඩරට කැරැල්ල'' ලෙස ප්‍රචලිතව පවත්නා, බ්‍රිතාන්‍ය ආක්‍රමණිකයින් හා ස්වදේශිකයින් අතර 1818 ඇති වූ අරගලයට එක්තරා ආකාරයකින් සාධාරණීකරණයවේ. මෙය ස්වදේශික දෘෂ්ටියෙන් නිදහස් අරගලයක්, නිදහස් සටනක් ලෙස හඳුන්වයි. එය කැරැල්ලක් බවට පත් වන්නේ, ඒ වනවිට මෙරට පාලන තන්ත්‍රයට සම්බන්ධ වූ කේන්ද්‍රීය බලවේග වූ රදළ ප්‍රභූවරුන් විසින් 1815 මාර්තු 02 වන දින ගිවිසුමක් මගින් නීත්‍යානුකූලව, බ්‍රිතාන්‍යයේ ජෝර්ජ් රජතුමාට ලියා දුන් ලංකා රාජ්‍ය හෙබවීමේ අයිතියට එරෙහිව නැගී සිටීමක් වන බැවිනි. තවත් අයුරකින් නීත්‍යානුකූලව පිළිගත් රාජ්‍ය පාලනයකට එරෙහිව කුමන්ත්‍රණකාරී ලෙස ආයුධ සන්නද්ධව නැගී සිටීමක් වන බැවිනි. එබැවින් අප එය උඩරට කැරැල්ල ලෙසින් අර්ථ දක්වන්නේ බ්‍රිතාන්‍ය පාලකයාගේ හෙවත් එරට රජය කරවූවන්ගේ දෘෂ්ටියෙන් බව ප්‍රකටවේ.

උඩරටින් ඇරඹි මෙම නිදහස් අරගලය හා එහි දිග, පළල මෙන්ම ගැඹුර ද විවිධ ඉතිහාස වාර්තාවලින් අධ්‍යයනයකට ලක්ව ඇත. මෙහිදී එම නිදහස්



8 - H 052065

අරගලය ආශ්‍රිතව පවත්නා ජනශ්‍රැති හා සාහිත්‍යමය සාධක විමර්ශනය කිරීමට උත්සුකවේ. එනම් නිදහස් අරගලය පිළිබඳ ජන විඥානය ගොඩනැගුණු ආකාරයත්, නිර්මාණකරුවන් එයට ලබාදුන් ආවේසයනුත් අධ්‍යයනය කිරීමයි. එය උඩරට කැරැල්ල ලෙස ප්‍රකට නිදහස් සටන පිළිබඳ ඉතිහාස වාර්තා හෝ ප්‍රවෘත්තිමය ලියකියවිලිවලට වඩා වෙනස් වූ අර්ථකථනයන් විය හැකිය. මෙහිදී විශේෂයෙන් අවධානය යොමු කර ඇත්තේ උඩරට කැරැල්ල හා ඊට සම්බන්ධ සිදුවීම්වලට ඇඳෙන චරිත කීපයක් ගැන පමණි.

## අරමුණු

නිදහස් අරගලය පිළිබඳ විමර්ශනයන් බහුල වශයෙන් සිදු වුණි ද, ජනශ්‍රැති හා සාහිත්‍යමය සාධක ආශ්‍රිත අධ්‍යයනයන් මගින් යම් භාවාත්මක හා නිර්මාණශීලී දෘෂ්ටියෙන් හෝ එම සාධක හඳුනා ගැනීමට උත්සුකවේ. මෙවැනි විමර්ශනයන් මගින් නව පරම්පරාව වෙත ස්වදේශික අභිමානය, වටිනාකම් හා ඇගයුම් පිළිබඳව හඳුන්වාදීමට ද හැකිවීම විශේෂත්වයකි.

## ක්‍රමවේදය

මේ සඳහා මුඛ්‍ය වශයෙන්, ලිඛිත මූලාශ්‍රය පරිශීලනය අනිවාර්ය ක්‍රමවේදයක්වේ. එසේම ඉතිහාස වාර්තා, සාහිත්‍යමය කෘති ඇසුරු කිරීමට සිදුවේ. එසේම යම් යම් නිරීක්ෂණයන් මගින් මෙන්ම සම්මුඛ සාකච්ඡා මගින් ද අවශ්‍ය තොරතුරු ඒකරාශී කර ගැනීමට සිදුවේ. බොහෝ විට මෙවැනි ඓතිහාසික අවස්ථා පිළිබඳ පැරණි අත්දැකීම් සහිත පිරිස් සමඟ සාකච්ඡා කිරීමෙන් දත්ත ලබා ගැනීමට හැකිවේ. එසේම ජනශ්‍රැති මෙන්ම සාහිත්‍ය නිර්මාණ, අන්තර් විචල්‍ය විශ්ලේෂණ ක්‍රමය උපයෝගී කර ගනිමින්, විශ්ලේෂණය කරමින් ලැබෙන තොරතුරු ද මෙම විමර්ශනයට උපයුක්ත කරගත හැකිය.

## සාකච්ඡාව

1818 උඩරට කැරැල්ල හෙවත් ශ්‍රී ලාංකේය ජාතිය බ්‍රිතාන්‍ය ආක්‍රමණිකයාගෙන් නිදහස් වීම සඳහා සිදු කළ තීරණාත්මක අරගලය, මෙරට ඉතිහාසයේ අමරණීය සන්ධිස්ථානයකි. එවන් අරගලයක් පැන නගින්නේ සමාජ, ආර්ථික හා දේශපාලන හේතු සාධක ගණනාවක පෙළ ගැසීමක ප්‍රතිඵලයක් ලෙසිනි. ඒ සඳහා ආසන්න පූර්ව වශයෙන් බලපෑ සාධක කීපයකි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අදූරදර්ශී පාලනයත්, ඒ හමුවේ ප්‍රභූ පාලක පැළැන්තියේ අභ්‍යන්තර සටකපටකම්, බෙදීම් සහ අසමගිය පමණක් නොව බලයට පත්වීමට පිළිමතලව්වේ සහ ඇහැළේපොළ ආදීන්ගේ කූටෝපක්‍රම ද බලපා ඇත. එසේම පාලකයා මද්‍යසාර භාවිතය ස්ත්‍රී ලෝලත්වය ආදිය ඔස්සේ දුර්වල චරිතයක් බවට පත්කර, එයින් පළිගැනීම, කෲරත්වය, වෛරය ක්‍රියාවට නංවා ජනතාව කලකිරෙන ආකාරයට කටයුතු සලස්වා ඉංග්‍රීසි ආක්‍රමණිකයා උපායමාර්ගික ලෙස අනුගමනය කළ ප්‍රතිපත්තිවලට

ප්‍රභූ පන්තිය සහ සාමාන්‍ය ජනයා ද රැවටීමට ලක්වූහ. එය ප්‍රයෝජනයට ගනිමින් මෙරට නීත්‍යානුකූල පාලකයා නොහොත් රජු ස්වදේශිකයින් විසින්ම පළවාහරින තැනට කටයුතු සලස්වන ලදී. එපමණක් නොව මෙරට රාජාණ්ඩු පාලන ක්‍රමය අවසන් කර, මෙහි රජකම ද බ්‍රිතාන්‍ය කිරුළ හිමි ජෝර්ජ් රජතුමාටම පැවරීමට අවස්ථාවාදී ප්‍රභූ පන්තියේ මානසික හා විෂය මූලික පෙළගැස්ම ද සකසා තිබුණි. නායක්කාර වංශික වඩුග රජෙක් යන හංවඩුව ගසා, ශ්‍රී වික්‍රම රාජසිංහ පළවාහැර, ජෝර්ජ් රජුගෙන් තනතුරු, නම්බුනාම, වරදාන වරප්‍රසාද ලබා ගැනීමට කල්පනා කළ රදළ ප්‍රභූ පන්තිය 1815 දී ගිවිසුමකට අත්සන් කරමින් බ්‍රිතාන්‍ය පාලකයාට නිල වශයෙන් ලංකාව ලියා දීමට කටයුතු කළහ. එයින් ඔවුන් අපේක්ෂිත පරමාර්ථ ඉටු නොවන බව දැනෙන්නට විය. පාලනය ජෝර්ජ් රජු සහ ඔහුගේ දේශීය නියෝජිතයින්ට අවශ්‍ය ආකාරයට මිස මෙරට බලකාමී, වස්තුකාමී, තනතුරු ලෝභී ප්‍රභූවරුන්ට වුවමනා පරිදි නොවන බව ප්‍රකට විය. සාමාන්‍ය ජනයාට ද එම පීඩනය එල්ල වූ අතර රජයට විරුද්ධව කැරලි ගැසීමට පෙළඹෙන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි. ඉංග්‍රීසිහු ජනවාර්ගික භේද ආගමික භේද ආදිය ද තම අරමුණු සපුරා ගැනීමට සූක්ෂම ලෙස භාවිත කරන්නට වූහ. මුද්‍රකරය සහ කන්ද උඩරට තවලම් ප්‍රවාහනය පාලනය කිරීම එතෙක් සිදු කළ සිංහල පවුල්වලින් ඉවත් කර හජ්ජි මුත්තු නම් මාතර සිට පැමිණි මුස්ලිම්වරයෙකුට පවරන ලදී. ඔවුන් ද බොරදියේ මාලු බාන තත්ත්වයට ඇද වැටෙමින්, ඉංග්‍රීසින්ගෙන් වරදාන වරප්‍රසාද ලබා ගනිමින් ස්වකීය අරමුණු සපුරා ගැනීමට උත්සුක වූ බව පෙනේ. ඒ නිසා ඔවුන් අතර දිර්ඝකාලීන අසමගිකම්, ගැටුම් හා අරගල ඇතිවී තිබේ.

වෙල්යාය ලක්ෂයකින් යුක්ත වූ බැවින් වෙල්ලස්ස වූ ඌවේ සශ්‍රීක භූමි පුත්‍රයින් අතරින් බිහිවූ කොහුකුඹුරේ රටේරාළ වැනි අය නිදහස් අරගලය අවුළුවන ලද බව ප්‍රචලිතය. හජ්ජිමුත්තු, සිල්වෙස්ටර් විල්සන් ආදීන් ඔවුන් මර්දනය කිරීමට පැමිණ මරුමුවට පත් වූහ. වෙල්ලස්සේ ඇවිළෙමින් තිබූ අරගල මැඩීමට ඉංග්‍රීසින් විසින් යවන ලද ඌවේ දිශාව වූ කැප්පෙටිපොළ මොනරවිල, අරගලකරුවන් සමග එකතු වීම ඉංග්‍රීසින්ට මරු පහරක් වූ බව පමණක් නොව කැප්පෙටිපොළ උඩරට නිදහස් අරගලයේ ප්‍රධාන ගිනිපුපුර බවට පත්විය. අරගලය ආශ්‍රිත ජනශ්‍රැතිවල බහුලව කැප්පෙටිපොළ පිළිබඳව සඳහන් වීම විශේෂත්වයකි.

දුම්බර වෙල්ලස්ස උලපන බිම් තැන්නේ
නැංවූ එදා ඔබෙ රණ හඬ අසමින්නේ
සිංහල සෙනග මහ පොර පිටියට පැන්නේ
කන්දක් ගරාගෙන සැඩ වතුරක් මෙන්නේ

අනුන් යටත ජීවත් වනවාට වඩා
සැණින් මැරෙනු යෙහෙකැයි උස් හඬින් දොඩා
රටුන් පිණිස දිවි දුන් මේ රටෙන් කුඩා
උපන් වීර පුරිසෙක් කෝ ඔබට වඩා

අල්ලව් ගනිව් පැනයන්නට නොදී ඉඩ
ගල්මෙන් සිටිව් කැපුවත් තොපි කඩින් කඩ
වෙල්ලස්සෙන් එදා ඔබ නැගු සටන් හඬ
සොල්ලා රටම රැවු දුනි මුහුදෙනුත් ගොඩ (මහින්ද ප්‍රබන්ධ පිටුව 173-174)

පවුල, අඹු දරුවන්, දේපළ ඉඩකඩම්, වස්තුව ධන ධාන්‍ය හෝ තනතුරු නම්බුනාමාදිය තමා සතුව තිබියදී ඒ සියල්ලක්ම පරිත්‍යාග කරමින්, අත්හරිමින් ස්වකීය ජාතභූමියත්, එහි නිවසන සුවහසක් ජනතාවත්, ඔවුන් සතු සකලවිධ වටිනාකම් ද සුරක්ෂිත කිරීම උදෙසා කළ පරිතත්‍යාගය ශ්‍රේෂ්ඨ ය. ඉංග්‍රීසීන් වෙතින් නේකවිධ වරප්‍රසාද ලබමින් ඔවුනගේ සුවච, කීකරු සේවකයෙක් ලෙස කටයුතු කරන කල්හි මෙරට ජනයාට කැප්පෙටිපොළ වීරයෙක් නොවුණි. ඔහු තවත් එක් ප්‍රභූවරයෙක් පමණි. එහෙත් අවශ්‍යම මොහොතේ වඩාත් සාධාරණ, යුක්ති සහගත තීරණය ගනිමින් ජනතාවගේ පාර්ශවය ගත් මොහොතේ සිට පෙරමුණෙහිම රැඳෙමින් ඉංග්‍රීසි අධිරාජ්‍යවාදියාට එරෙහිව නැගී සිටීම නිසා කැප්පෙටිපොළ ජනතාවගේ පූජනීය, ගෞරවණීය මිනිසෙක් බවට පත්වේ. එපමණක් නොව තමා විසින් ගත් අදීන, නිවහල් තීන්දුව වෙනුවෙන් අවසන සතුරාගෙන් ලැබුණු මරණීය දණ්ඩනය වැළඳගත් ආකාරය පරමෝදාරය. ඔහුගේ වීරත්වය කිරුළු දරන්නේ එකී අභීන, ජීවන පූජාවත් සමඟය. උත්තරීතර පොදු සමාජීය අරමුණු සාධනය උදෙසා තමා සතුව පවත්නා ශ්‍රේෂ්ඨතර වස්තුව වන ජීවිතය පරිත්‍යාග කිරීමට හැකිවන්නේ බෝධිසත්ව ගුණෝපේත උදාර මිනිසුන්ට පමණි. කැප්පෙටිපොළ පරමාදර්ශය ඇගයුමට ලක් කළ යුතු වන්නේ මෙකී ගුණාංග හිමි කරගත් මෑත ඉතිහාසයේ ලක් මෑණි සතු වූ මිනිසා ඔහු වන බැවිනි.

වීරාභිවාදනය ලෝකයේ එක් ප්‍රකට සාහිත්‍ය පරම්පරාවක් නියෝජනය කරයි. ස්වකීය ජාතභූමිගත උත්තුංග පොදු පරමාර්ථ සාධනය වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කිරීම එවන් විරුවන් ජනිත වීමට හේතු වී තිබේ. සොක්‍රටීස් නම් ග්‍රීක දාර්ශනිකයාට වස බඳුනක් පානය කර මරණයට පත් වීමට සිදු වන්නේ ඔහු මානවයා විෂයෙහි සදාචාරවාදයක් දේශනාකරමින්, විතණ්ඩවාදීන්ගේ කෲර වුවමනාවන් විවේචනයට ලක් කිරීම නිසාය. භාරතයේ භගත් සිං එවැන්නෙකි. අතරමැද කොන්දේසිවලින් තොරව ස්වකීය ජාතියේ විමුක්තිය වෙනුවෙන් අවසන් පණ නළ තෙක් ඔවුහු සටන් කළහ. කියුබාවේ ජොසේ මාටි ද, නිකරගුවාවේ ඔගස්ටෝ සැන්ඩිනෝ ද, වෙනිසියුලාවේ සයිමන් බොලිවාර් ද ස්වකීය මාතෘභූමීන්හි විමුක්ති අරගලයන්හි අසමසම ශක්ති ප්‍රවාහයෝ වූහ. කැප්පෙටිපොළ විරුවාගේ දේශප්‍රේමීත්වය ද මෙකී ජාත්‍යන්තර චරිත සමඟ මනා ලෙස සමපාතවේ. රාජ්‍ය සම්මත මාධ්‍ය තුළ ඔවුන් ද්‍රෝහීන් හෝ කුහකයන් පිරිසක් ලෙස හංවඩු ගැසෙන විට ජන අධ්‍යාත්මයන්හි ඔවුහු සදානුස්මරණීය

විමුක්තිදායකයින්, වීරවරයන් වන්නාහ. එබැවින් ජනහද ගැහෙන රිද්මයෙන් පෝෂිත ජනශ්‍රැතියෙහි කැප්පෙටිපොළ විරුවෙක් බවට පත්වේ. මේ නිසා මෙරට බහුතරයක් ජන අධ්‍යාත්මයන්හි වීර විමුක්ති සංකේතයක් ලෙස කැප්පෙටිපොළ ඇගයුමට ලක්වේ.

දළදා වහන්සේ සමඟ මෙරටට පැමිණි බ්‍රාහ්මණ වංශික පරපුරකින් මොනරවිල, කැප්පෙටිපොළ පරපුර පැවත එන බව විශ්වාස කෙරේ. එය ඇතැම් විට කුල ගර්වය පිණිස ඇති කරගත් මතයක් විය හැකිය. මාතලේ ගොලහැල (ගොලහැර) දියවඩන නිළමේගේ පුත්‍ර කැප්පෙටිපොළ මොනරවිල ජන්ම ලාභය ලබන්නේ සතර කෝරළේ බඳගල්බොඩ, කැප්පෙටිපොළ නම් ප්‍රවේණි ගම්මානයේය. වයස අවුරුදු දහය වන විට අසුපිට යාමට පුරුදු වූ ඔහු වයස අවුරුදු දාහත වන විට විවිධ සටන්ක්‍රම පිළිබඳ මනා පුහුණුවක් ලබාගත් බව කියැවේ. මොනරවිල ගමේ තිබෙන ඉලංගම් මඩුව ඔහු එම සටන් පුහුණු වූ ස්ථානය බවත්, ඒ සඳහා ලෙව්කේ පරම්පරාවේ දක්ෂ යුද පුහුණුකරුවකු මොනරවිල වලව්වේ නවත්වාගෙන සිට ඇත.

අලුයම අවදිවන කැප්පෙටිපොළ විවිධ පොතපත අධ්‍යයනය කරන අතර ඒ පොත්පත් බොහෝ විට ධර්ම ග්‍රන්ථයන් ය. පක්ෂීන් අවදිවීමට පැයකට පමණ පූර්වයෙහි මොහු ඉලංගම් මඩුවට යන්නේ පිරිසිදු ජලය බඳුනක් පමණක් පානය කිරීමෙන් පසුවය. ශාරීරික ව්‍යායාම්වලින් පසුව මොනරවිලෙන් ස්නානය කර උදෑසන ආහාරය එහිදීම ගනී. ඉනුපසු ශාස්ත්‍රෝද්ග්‍රහණය පිණිස ගමේ පන්සලට යන අතර දිවා ආහාරයෙන් මද විවේකයකට පසුව නැවත ඉලංගම් මඩුවට යන්නේ සටන් අභ්‍යාස සඳහාය. කඩු, කිණිසි, හෙල්ල, ඊතලය, දුන්න, යගදාව, පළිහ, මුගුර, කලබොණ්ඩය ආදී මෙරටට හුරු ආයුධ පමණක් නොව ගජනාව, තුවක්කු ආදී ආයුධ ද පුහුණු වූ බවට කියවේ. එසේම ජ්‍යෝතිර්වේදය අනුව එම ආයුධවලට සුදුසු හෝරා හා අරක්ගත් දෙවිදේවතාවුන් ගැන පවා හදාරා තිබේ. කාය වර්ධන අභ්‍යාස මෙන්ම යෝගී ව්‍යායාම භාවනා ආදිය මගින් මානසික අභ්‍යාසයන්හි ද නිරතව ඇත. අංගම්පොර, මල්ලවපොර ආදී ක්‍රීඩාවේ ද නිපුණයෙකි. එසේම හෙළ වෙදකම හා භූත විද්‍යාවන් ද, නිල ශාස්ත්‍ර, කෙම්ක්‍රම ආදිය පිළිබඳව ද දැනුමක් ලබාගෙන ඇත. තම නැගණියට ද අසු පිටයාමට පුරුදු කර ඇත්තේ අනාගතයේ කුමන තත්ත්වයකට හෝ මුහුණ දීමට සූදානම් කරවීමක් නිසා බව සිතිය හැකිය. ඔහු අඩි පහයි (5) අඟල් හතරක් (4) පමණ සාමාන්‍ය දේහයකින් යුක්ත වූ අතර දක්ෂ අශ්වාරෝහකයෙක් විය. මොනරවිල සිට මහනුවරට සැතපුම් විසි පහක පමණ දුර හෝරා තුනකින් යාමට තරම් ධාවක ශක්තියකින් හෙබියේය. මව් පිය ගුරුවරුන් කෙරෙහි ද ආගම දහම කෙරෙහි ද ගෞරවයෙන් කටයුතු කළේය. දිනපතා උදේ, හවස බුදුන් වැඳීම දිනචර්යාවේ කොටසකි. ඔහුගේ සටන්කලා නිපුණතාව මෙන්ම ශරීර ශක්තිය පිළිබඳ විවිධ ජනප්‍රවාද පවතී.

ජනශ්‍රැතියේ එන කැප්පෙටිපොළගේ යථෝක්ත සාමාන්‍ය දින චර්යාවට සම්බන්ධ තොරතුරු ක්‍රමානුකූලව කිසියම් ඉලක්කයකට ජීවිතය මෙහෙයවන ඕනෑම අයෙකුට පරමාදර්ශයක් ලෙස පෙන්වාදිය හැකිය. රට ජාතිය හමුවේ ස්වකීය යුතුකම්, වගකීම් ඉටු කිරීමට අවශ්‍ය ඇප කැපවීම, අභ්‍යාසය හඳුනාගැනීමට කදිම නිදර්ශනයක් ලෙස දැක්වීමට පුළුවන. තම පියාණන් වූ ගොලහැල නිලමේ දළදා මාලිගාවේදී පය ලිස්සා වැටී මරණයට පත්වීමෙන් අනතුරුව තරුණ කැප්පෙටිපොළ රාජ්‍ය සේවයට එකතු විය. ඒ මාතලේ දිසාව ලෙසිනි. තරුණ කැප්පෙටිපොළ දිසාවගේ නායකත්වයෙන් වන්නි සටන මෙහෙයවා එය ජයගැනීම සුවිශේෂී සිදුවීමකි. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ප්‍රසාදය කැප්පෙටිපොළ කෙරේ වර්ධනය වීමට මෙය බලපෑවේය. එහෙත් උඩරට අනෙකුත් ප්‍රභූවරුන්ගේ නොමනාපය පිණිස ද හේතුවී ඇත.

ඉංග්‍රීසීන් උඩරට ආක්‍රමණය කිරීමට සූදානම් වනවිට රජු නිලමෙවරු කැඳවා ඒ සඳහා මුහුණ දීමට ඇති ශක්තිය පිළිබඳව විමසන ලදී. ඇහැලේපොල, මඩුගල්ලේ, එක්නැළිගොඩ, මොල්ලිගොඩ ආදී සියලුම නිලමෙවරු තමාට ප්‍රමාණවත් හමුදාවක් නැති බැවින් එම ආක්‍රමණයට මුහුණ දීමට අපහසු බව අවධාරණය කළහ. එහෙත් තරුණ කැප්පෙටිපොළ නිලමේ තම රට, ජාතිය, රජය ආරක්ෂා කිරීමට මරුවා සමඟ වුව ද සටන් කිරීමට සූදානම් බව කිව්වේය. රජු ඔහුගේ නිර්භීතකමට අතිශයින් පැහැදුනේය. මේවැනි නිවට නියාලු මිනිසුන් ගොඩක් මැද එක් අභීත සිංහලයෙක් සිටීම ගැන රජු ප්‍රසංසාත්මකව කතා කළේය. ඔහුට සටන සූදානම් කිරීමට පැවරුවේය. එහෙත් භාණ්ඩාගාරය පිරිහී තිබූ නිසාත් අනෙකුත් නිලමෙවරුන්ගේ විරෝධතා නිසාත් එය සිදුකළ නොහැකි විය. කැප්පෙටිපොළ මාතලේ දිසාවෙන් ඌව දිසාවට උසස් වීමක් දී මාරු කර යවන ලද්දේය. දෙල්වල එතනහාමි නම් සුරූපී කාන්තාවක් සමඟ විවාහ වූ කැප්පෙටිපොළ අවංකව තම රාජකාරි සිදු කිරීමට උත්සුක විය.

මේ අතර 1815 පෙබරවාරි 14 දින ඉංග්‍රීසින් උඩරටට පැමිණි අතර පෙබරවාරි 18 දින රජු අත් අඩංගුවට ගෙන උඩරට අල්ලාගත් බවට නිල වශයෙන් ප්‍රකාශ කරන ලදී. 1815 මාර්තු 02 වන දින මහනුවර මඟුල් මඩුවේදී සමුළුවක් පවත්වා ගිවිසුමක් අත්සන් කොට III වන ජෝර්ජ් රජුට උඩරට රාජ්‍ය පවරා දෙන ලදී. එය ලාංකේය ස්වාධීන රාජ්‍යය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් දේශයක් බවට පත් කරන ලද ඛේදනීය අවස්ථාවයි. නිලමේවරුන් විසින් ගන්නා ලද මෙම තීන්දුවේදී කැප්පෙටිපොළට ද පක්ෂවීමට සිදු විය. ඔහු ද එම ගිවිසුමට අත්සන් කොට ඇත. ඔහු ඉංග්‍රීසි පාලනක්‍රමය අනුව ඌව දිසාවේ රාජකාරි ඉටු කළේය. එසේම වෙල්ලස්සේ දිසාව ද ඔහුටම භාර විය.

මේ අතර උඩරට වෙළහෙළදාම් කටයුතුවල යෙදී සිටි මරක්කලයින් ඉංග්‍රීසීන්ට උපරිම සහාය දැක්වූ අතර උඩරට ස්වදේශී නායකත්වය පිළිබඳ චෝදනාත්මක තොරතුරු ඉංග්‍රීසීන් වෙත වාර්තා කරන්නට විය. තම ආගමික මුලාදෑනියෙකු පත්

කරන ලෙස කළ ඉල්ලීමට ඇහුම්කන් දුන් ඉංග්‍රීසිහු හජ්ජි නමැත්තෙකු ඒ සඳහා පත් කරන ලද්දේය. ඔවුහු ඉංග්‍රීසීන්ට පාර්ශවීය සහයෝගයක් දැක්වූ අතර උඩරට ප්‍රභූවරු නොතකා හරින ලදී. ඉංග්‍රීසීන් ද මොවුන් ඔත්තුකරුවන් ලෙස පවා යොදාගෙන ඇත. එසේ පත් කළ හජ්ජි මුහන්දිරම් සහ ඉංග්‍රීසි පාලනය පිළිබඳ ජනතාව තුළ දැඩි කළ කිරීම් ඇති වී තිබුණි. කැප්පෙටිපොළ ඉංග්‍රීසීන්ගේ පාලන තන්ත්‍රයට අනුගතව කටයුතු කළ ද ඔවුන්ගේ ජනතා පීඩක බදු ප්‍රතිපත්තියත්, බුදු දහම හා උඩරට සංස්කෘතියට කරන ගැරහීමක් ඉවසුම් නොදෙන කරුණු විය. බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ලාංකීය ජනයා මෙහෙයවීමට රජෙක් නොසිටීම ගැන ද ඔහුගේ කනස්සල්ලක් පැවතුණි.

දිනක් කැප්පෙටිපොළ දළදා මාලිගාවට ගිය විට දෙගල් දොරු විහාරවාසී කුංකුනාවේ හිමියන් විසින් කියන ලද කවි දෙකක් අසන්නට ලැබිණ. එය කැප්පෙටිපොළ තුළ මහත් කම්පාවක් මෙන්ම ධෛර්යයක් ද ඇති කළ බව ප්‍රකට වේ.

''අනේ කුඹියනේ - තොපටත් රජෙක් ඉන්නේ
මොකදැ කොරන්නේ - අපේ කරුමේ අපට වන්නේ
රජෙක් ලැබුණෝතින් - කැවුම් කිරිබත් කඤ්ඤං
පෙරහැර කරඤ්ඤං - සාදු නාදෙන් ගිගුම් දෙඤ්ඤං''

මෙය කණ වැකුණු කැප්පෙටිපොළ නිලමේ තුළ නැවත දළදා පෙරහැර පැවැත්වීමත්, බුදු දහම රැක ගැනීමත් පිළිබඳ සිතිවිලි තදින්ම දැනෙන්නට ඇත. ඊර්ෂ්‍යාව, බලතණ්හාව, තනතුරු ලෝභය, වරප්‍රසාදාදිය මත භේද භින්නව සිටින පිරිසක් සමඟ ජාතිය බ්‍රිතාන්‍යයන්ගෙන් කෙසේ නිදහස් කරගන්න ද යන පැණය ඔහු තුළ ගිගුම් දෙන්නට ඇත. මේ වනවිට කැළඹී තිබූ වෙල්ලස්ස සමථයකට පත් කිරීම සඳහා ඉංග්‍රීසි ආණ්ඩුව විශ්වාසය තබන ලද්දේ කැප්පෙටිපොළ වෙතය. ඒ අනුව ඔහු වෙල්ලස්සට පිටත් වූයේ ආයුධ සන්නද්ධ හේවායින් කීප දෙනෙක් ද සමගිනි. කුංකුණාවේ හිමිගේ උපහාසාත්මක පද්‍ය මෙන්ම එතුමන්ට හිතවත් මහ පණික්කිරාළ විසින් පෙන්වා දෙන ලද ජාති මාමකයකුගේ යුග කාර්යභාරය පිළිබඳ අදහස් කැප්පෙටිපොළගේ සිත තුළ දෝංකාර දෙන්නට ඇත.

වෙල්ලස්සේ ජනතාව ''දෙයියෝ'' නමින් හඳුන්වන ලද දොරේසාමි නම් ව්‍යාජ රජකුගේ නායකත්වය වටා ඒකරාශී වී සේනා සංවිධානය කර ඉංග්‍රීසීන්ට එරෙහිව අරගලය මුවහත් කරමින් සිටියහ. කැරළි නායකයකු වූ කොහුකුඹුරේ රටේ රාල තමන් මර්දනය කිරීමට ඉංග්‍රීසි හේවායින් සමඟ පැමිණෙන කැප්පෙටිපොළ නිලමේ අමතා ප්‍රකාශ කරන ලද්දේ '' නිලමේ තුමනි! අපේ මේ සටන රජ සැප විඳීමට නොවේ. අසරණ රටත්, ජාතියත්, බුද්ධ සාසනයත් බේරා ගැනීමටයි. ඔබ අපට එරෙහිව සටන් කරන්නේ නම් එය රට, ජාතිය, ආගමට කරන සතුරු කමකි.'' යනුවෙනි. එයින් කැප්පෙටිපොළ තවදුරටත් අවදි විය. ඔහු ඉංග්‍රීසි හේවායින් ආයුධ

සමගම ආපසු හරවා යවා අරගලය සමඟ එක් විය. එතැන් සිට සටනේ නායකත්වය කැප්පෙටිපොළට හිමි විය. ඔහු වීරයෙක් ලෙස අභිෂේක ලබන ප්‍රමුඛ අවස්ථාව මෙයයි. මන්දයත් සතුරාගේ උපාය, උපක්‍රම මනා ලෙස දැන හඳුනාගෙන ඔහුට එරෙහිව නැගී සිටීමට අවශ්‍යම වේලාව හරියටම හඳුනාගෙන සටනට ජවය ලබාදීමයි. හඟුරන්කෙත දියතලා කන්ද පාමුල දී තම සේනාව අමතා කැප්පෙටිපොළ විරුවා කළ කතාව විවිධ ජනශ්‍රැති මූලාශ්‍රය ඇසුරින් ප්‍රතිනිර්මිතව ඇත. සැබැවින්ම එය ජාතියට පන්නරය ලබා දෙන ඓතිහාසික ප්‍රකාශනයකි.

''අද අප සිටින්නේ ලෝභයත්, කොල්ලකෑමත් තමන්ගේ ධර්මය කරගෙන මහ මුහුද හරහා සැතපුම් හත්දහසක් ගෙවා අවුත් සිටින අපේ ජාතියේ, සංස්කෘතියේ හා ආගමේ සතුරා වන දුෂ්ට, විශ්වාස ඝාතක පරදේශක්කාර සතුරාගේ සන්නාහ සන්නද්ධ සේනාව ඉදිරියෙනි. තථාගතයන් වහන්සේ තමන් වහන්සේගේ ධර්මය මේ රටේ සුප්‍රතිෂ්ඨිතව බැබලේවායි අවුරුදු දෙදහස් පන්සියයකට උඩදී අධිෂ්ඨාන කළ සේක. ඉතින් පරදේශක්කාරයෙකුට මේ ශුද්ධ ද්වීපයෙහි, ජයකොඩි නංවන්නට ඉඩ නොදෙමුයි අපි අධිෂ්ඨාන කර ගනිමු. යුද්ධයේදීත්, සාමයේදීත් පුත්‍ර ස්නේහයේදීත්, පීතෘ ස්නේහයේදීත්, මනුෂ්‍ය සානුකම්පාවේදීත්, පුරුෂ සිංහ විලාසයේදීත් අපේ ශ්‍රේෂ්ඨ මුතුන් මිත්තන් අවශේෂ ලෝකයාට ආදර්ශයක් දුන් මේ රටේ ඔවුන්ගෙන් පැවතෙන්නන් වන අප චිත්ත ධෛර්ය වෙනුවට තුවක්කු බලයේ පිහිටෙන් ජයගෙන සිටින මිනිසුන් වර්ගයක් ඉදිරියෙහි නැතිගෙන කිබ ගැසූ බවක් කියන්නට ඉඩ නොදෙමු. ගම් නියම්ගම්වලටත් මහා ප්‍රභූන්ගේ ගෙවල් දොරවල් වගේම ගොවියාගේ පැල්පතේදීත් රට පුරාම සෑම තැනකම අපේ වර්ගයාගේ පක්ෂපාතකමටත් ජාත්‍යාලයටත් පින් සිදුවන්නට නිරවශේෂයෙන්ම සෑම මිනිසෙක්ම ජාතියේ ඇමතීමට කන්දී ලහි ලහියේ අවි ගන්නට සැරසෙන්නේ ය. ඔවුහු අපේ පෙළට එක් වීමට ගමන් කරමින් සිටිති. ඉතින් අප නොබෝ කලකින් අපේ සතුරු සේනාව මෙන් කීප ගුණයකින් වැඩිවනු ඇත. අපේ දරුවන් හා ලාබාලයන් කෙරෙහි අපේ ඇති ස්නේහය තකා අපි එක්කෝ අපේ ජාතියේ සතුරන් පාගා දමමු. නැතහොත් නම්බුකාර හැටියට දිවි පුදමු.''

කැප්පෙටිපොළ ජනතා අරගලයට එකතුවීම ඔහුගේ වීරත්වයේ හා අදීනත්වයේ ප්‍රබල ගුණාංගයක් බැව් ප්‍රකටවේ. ඌව වෙල්ලස්ස නම් වූ අතිශය සශ්‍රීක කලාපය, ගහවැලට පෝෂණය සැපයූ සේම එහි නිවසන මානව පරම්පරාවන්ට ද ජීවසාරය කවා පොවා තිබේ. සියදහස් ගණනින් රොද බැඳි පරදේශක්කාර ඉංග්‍රීසි ජාතිකයින්ට එරෙහිව තම ශක්ති ප්‍රමාණයෙන් නැගී සිටින්නේ එහෙයිනි. ඒ වීරෝදාර මිනිසුන්ගේ සටන්කාමී රණහඬ ඌවේ කඳු ගිරි ශිඛර අතර දෝංකාර දෙමින් මව් බිමට අපමණ සෙනෙහස දක්වන මිනිසුන්ගේ හෘදයාභ්‍යන්තරයට කාවැදී කල්පාන්තරයක් නොමැකී පවතින ලෙසට සනිටුහන් වී ඇත. මෙරට ජනශ්‍රැතිය හා සාහිත්‍යය එකී වීරත්ව වර්ණනාවන්ගෙන් සුපෝෂිතය.

වැලිගල කවිසුන්දර මුදලි රචනා කරන ලද ''ඉංග්‍රීසි හටන'' නම් කෘතියේ දේශීය කැරලිකරුවන් ගෙන් ඉංග්‍රීසින්ට සිදු වූ හානිය අභිමානයෙන් දක්වයි

''පැදුල්ලේ නොව මාවැලි ගඟ මෙන් ලේවතුරු වැටිය
පාවුල්ලේ නුවරට සැදූ අමු සොහොනක් ලෙස පිහිටිය
වී ලොල්ලේ රැක සිටිනා රකුසු පියස් උකුසු කැටිය
වාගොල්ලේ පිටිය මෙදන් ඉංග්‍රීසි මිනි කඳන් පිටිය''

වීරාභිවාදනයක නිරත වන ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියෝ, ජාතික කොඩිල්ල නම් පැදි සංග්‍රහයේ කැප්පෙටිපොළගේ සුරු-විරුකම් අනාගත පරපුරේ පෞරුෂ සංවර්ධනයට උපයුක්ත කර ගනී. පුතු නින්දට යන්නේ ජාතියේ විරුවන්ගේ අභිමානය මනසේ රඳවා ගනිමිනි. ජාතියේ සැබෑ සුව නින්ද එය බව ප්‍රකට කරයි.

''කැප්පෙටිපොළ සෙනෙවි සුරු
බිඳ රුපු සෙන් මන් දුදුරු
අභිරු විකුම් පෑ අයුරු
නුඹට පුතේ වෙයි මිතුරු''

යනුවෙන් නිරූපණය කරන්නේ එයයි. ලක්‍ෂයක් වෙල්යායවලින් සුපෝෂිත වෙල්ලස්ස සතුරාට එරෙහිව නැගී සිටියේය. එක හූ හඬ කන්දෙන් කන්ද රාව ප්‍රතිරාව නැගෙමින් කණ වැකෙනවිට මිනිසුන් ඒක රාශීවන ඌවේ අවි ආයුධ මුවහත් වූයේ ඒ අපූරු සන්නිවේදනයේ මහිමයෙනි. සතුරා අවස්ථා කීපයකම දුබලවිය. කැප්පෙටිපොළ ඇතුළු සුරු-විරුවන්ට කඳුගිරි ශිඛර, වන, ලැහැබ, දියකඳුරු, ඇල දොළ, ගහ කොළ, සතා සිව්පාවා සියල්ල හුරු පුරුදුය. මහවැසි, සුළං සක්‍රීය වෙද්දී ඔවුනට සටන අපහසු නොවුණි. ඒත් ඉංග්‍රීසි සේනාවට ඒ සියල්ල බාධකය, අවහිරතාවන්ය. අභියෝගයන්ය.

''දුම්බර වෙල්ලස්ස උලපන බිම් තැන්නේ
නැං වූ එදා ඔබෙ රණ හඬ අසමින්නේ
සිංහල සෙනඟ මහ පොර පිටියට පැන්නේ
කන්දක් ගරා ගෙන සැඩ වතුරක් වැන්නේ''

යනු එස්. මහින්ද හිමියන් ඒ වීරත්වය පද්‍යයට නගා ඇති මහිමයයි. ඉංග්‍රීසි සේනාවෝ අබල දුබල වන්නේ ඒ හේතුවෙනි. කැප්පෙටිපොළ ඇතුළු බල සේනාවන්ට මුහුණ දීමට දුෂ්කර වනවිට ඔවුන් ගොවිතැන් බත්, වගාබිම්, ගහකොළ, ගේ දොර, හරක බාන ආදී අප සතු සම්පත් සමූලඝාතනය කර විනාශ කරන්නට විය. එපමණක් නොව කාන්තාවක් සහ කුඩා දරුවන් ද මරා දමන්නට විය. නීතිය යුක්තිය පිළිබඳ ලෝකයට පාඩම් කියාදෙන්නට තතනන බ්‍රිතාන්‍යයාගේ

සැබෑ සාහසික යක්ෂාවේශය මතුවන්නේ එහිදීය. කිරි සප්පයින් සිය දහස් ගණනින්, මව් ඇකයෙන් උදුරාගෙන මරා දැමීමට තරම් ඔවුහු ම්ලේච්ඡ වූහ. අහිංසක කාන්තාවන් නොයෙකුත් වේදනාවන්ට පත්කොට විනාශ කළහ. ඌව-වෙල්ලස්ස මෙන්ම අනෙකුත් ප්‍රදේශවල ජීවත් වූ සාමාන්‍ය ජනයා පීඩාවට පත් කළහ. කැප්පෙටිපොළ ඇතුළු සටන් පෙරමුණේ රාළලා වූ සියල්ලෝ කම්පිත හෘදය මාංශ ඇත්තෝය. එසේ නොවන්නේ නම් තම ජීවිත සුඛ විහරණය පසෙකලා ජීවිත බිල්ලට දෙමින් මාතෘ භූමියත්, එහි උරුමයත්, ආගම දහමත් රැක ගැනීම වෙනුවෙන් සටන් නොකරනු ඇත. එහෙත් සුදු අධිරාජ්‍යවාදියාගේ වරදාන, වරප්‍රසාද, අරක්කු බෝතලය, සිගරැට්ටුවට වහවැටුණු ස්වදේශික නායකයින් කියාගත් නිවටයින් පිරිසක් එක් පසෙකින් ක්‍රියාත්මක වූහ. තවත් පසෙකින් මේ රටේ කුරුඳු, ගම්මිරිස්, සාදික්කා, එනසාල් ආදිය මිලදී ගනිමින් නොයෙකුත් බඩු භාණ්ඩ අලෙවියට මග පාදා ගනිමින්, අවසන මෙරට ඉඩකඩම් දේපළ ඉතා අඩු මිලට ගනිමින් සටකපට ලෙස කටයුතු කළ මරක්කලයින්, මුස්ලිම්වරු ආදීන්ගේ පාවාදීම් බහුල විය. එසේම ගොවිතැන්බත් විනාශ කිරීමෙන් ආහාර පානාදිය හිඟ වීමත්, දුර්භික්ෂය, රෝග ආදිය පැතිරීම නිසා සටන් බිමේ සිටියවුන් මෙන්ම ජීවත්ව සිටි පිරිස දුර්වල වන්නට විය. ඒ සියල්ලටම වඩා සටනේ නියැලුණු අය අතර ද අසමගිය, ක්‍රෝධය, වෛරය වර්ධනය වීම වඩාත් බරපතළ වූ බැවින් සටන තවදුරටත් අඩපණ විය. එහි වාසිය අත්පත් වූයේ ඉංග්‍රීසීන්ට ය. ඒ වනවිට රෝගාතුරව සිටි වීර කැප්පෙටිපොළ සහ තවත් සටන් සගයින් ගණනාවක්ම මුස්ලිම් උපාය දූතයින් හෙවත් පාවා දෙන්නන්ගේ ඔත්තුවකට අනුව ඉංග්‍රීසින්ට අත්අඩංගුවට ගැනීමට හැකි විය. එය ලාංකීය ජාතියේ මහා ඛේදවාචකයක ආරම්භය විය. ඇහැලේපොළ හටන නම් කෘතියේ එදවස රටේ පැවතියාවූ දුෂ්කර ස්වභාවය දක්වා තිබේ.

''අවුරුදු එකක් කොලහල රට පැතිර එන
මහදුක් කැලෑවල විඳිමින් නොයෙක් දන
සොඳ මුදු අහර නොලදින් වන ඵල කමින
තද රුදු නිරා දුකයේ දවසැර උන්න''

'' පන්නා යුද ලැබගෙන ඉංග්‍රීසි සෙන්ද
දස අත විහිද කඩු දුනු හී දරමින්ද
සතතත ගෙවල් ගිනිලා බඩු කොල්ලන්ද
අනත දනන් මැරුවෙය සිතු පමණින්ද''

කැප්පෙටිපොළ අත්අඩංගුවට ගැනීමත්, හිස ගසා මරා දැමීමත් අතර කාලය පිළිබඳ විශාල ජනශ්‍රැති ප්‍රමාණයක් ගොඩනැගී ඇත. ඒවා සමාන්තර වන අතර සුළු-සුළු

වෙනස්කම් සහිතය. එතුමන්ගේ අවසාන නිමේෂය එක් පසෙකින් සංවේගදායක ලෙස ද, තවත් පසෙකින් වීර වික්‍රමාන්විත ලෙස ද නිරූපණය කිරීමට ජන සාහිත්‍යකරුවෝ මෙන්ම නූතන සාහිත්‍යකරුවෝ ද උත්සුක වී තිබේ. කැප්පෙටිපොළ මහනිලමේගේ අවසාන ප්‍රාර්ථනාව පාලි ගාථාවකට හෙවත් කාව්‍ය ප්‍රබන්ධයකට නගා ඇත.

''ඉතෝ චුතෝ හං වර ජම්බුදීපේ
හිමාලයේ හේමමයම්හි කූටේ
කප්පායුකෝ දේව පතීච හුත්වා
මෙත්තෙය්‍ය නාථස්ස සුනෝමි ධම්මං''

එයින් කියැවෙන්නේ ''මෙලොවින් චුත වී යන මා උතුම් දඹදිව හිමාල වනයෙහි ස්වර්ණ කූටයට කල්පයක් ආයුෂ ඇති දේව නායකයෙකුව ඉපදී මතු බුදු වන මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ධර්මය ශ්‍රවණය කිරීමට හේතු වාසනා වේවා'' යන්නයි. එතුමන්ගේ හිස ගසාදමන අවසන් නිමේෂයේ පවා බුද්ධ වන්දනාව සිදු කරමින් ධාර්මික ප්‍රසාද චින්තනයෙන් මරණයට පත් වූ බව නොයෙක් ලේඛනවල ද ජනප්‍රවාදයේ ද සඳහන්වේ. ජන සාහිත්‍යයේ එන කවියකින් කැප්පෙටිපොළ පරපුරේ අය සැඟවගත් ජීවිත ගත කළ බව කියවේ.

''වීර විකුම් කැප්පෙටිපොළ නම සුද්දේ
රාජ උතුම් වංසෙ දිනූ සුවි සුද්දේ
අතුරුපාන සඳපානේ දුනු මැද්දේ
ගලබඩ රදල මැති පැරදුනි මර යුද්දේ''

වශයෙනි. දේශයේ විමුක්තිය වෙනුවෙන් සටන් කර සතුරාගේ කඩු පහරට හිස දන් දුන් වීර කැප්පෙටිපොළගේ වීරාභිවාදනය උද්දීප්ත වන්නේ මරණින් පසුවය. එයට එක් හේතුවක් වන්නේ එතුමන් මරණයට මුහුණ දුන් අභීත, අදීන විලාසයයි. ඒ බැව් ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන්ගේ පද්‍ය ප්‍රබන්ධයක අපූර්ව ලෙස ප්‍රතිනිර්මාණයවේ.

''අන්තිම වෙලාවේදීත් සිංහල බලය
පෙන්වා මුළු ලොවට සොලවා රුපු බලය
දුන්නේ අසිපතට නොපැකිල සිය හෙලය
සෙන්පති වීර සිංහල කැප්පෙටිපොළය

ඇඳිපට සළුව සෝදා දළදා හිමිට
පුදකොට නමැද යොදවා සිත බණ පොතට
මරණෙට මුහුණ පෑ කැප්පෙටිපොළ නමට
ගරු කටයුතුය මුළු රට එකතුව එකට''

උපතින් සුවපහසු කාමභෝගී ජීවිතයකට අවැසි වටපිටාවක් සහිත පරපුරක උරුමය ලද මුත්, අඹු දරුවන්, ගේ දොර, ඉඩකඩම්වලට වඩා සිය මාතෘ භූමියේ ද එහි නිවසන ජනයාගේ ද, ආගම දහම හා උදාර සභ්‍යත්වයේ ද පරම අයිතිය සුරකිනු වස් කැප්පෙටිපොළ විරුවාණන් කළ පරිත්‍යාගය ශ්‍රේෂ්ඨය. උත්තරීතරය. මරා දමන ලද කැප්පෙටිපොළගේ හිස් කබල වෛද්‍ය හෙන්රි මාෂල් විසින් ස්කොට්ලන්තයේ එඩින්බරෝ කෞතුකාගාරයේ කපාල විද්‍යා සංගමයට භාරදී ඇත. පසුව ලංකාවට නිදහස ලබා දීමෙන් පසු මේ උදාර මිනිසාගේ හිස් කබල, ඉංග්‍රීසීන්ගේ පෙර වැරදි වසා ගැනීමට මෙන් නැවත මෙරටට භාර දී තිබේ. එය කලක් මහනුවර කෞතුකාගාරයේ මහජන ප්‍රදර්ශනයට තැන්පත් කර තිබුණි. පසුව එය මහමළුවේ වළලදමූ බව ද කියවේ. එහෙව් උදාර මිනිසෙකුගේ හිස් කබල ද කතා කරයි. එය ද නිර්මාණකරුවන්ගේ වස්තුබීජය බවට පත්ව ඇති එක් අවස්ථාවකි.

''ඇත කටුගෙයි හිස්කබලක්
ලබමින් නෙක ගරු බුහුමන්
අසන්නෙමි මෙසේ පැනයක්
එම්බා හිස්කබල
කැප්පෙටිපොළ මොනරවිල
කුමක් සඳහා මෙහි සිටින්නෙහි ද?
එරෙහිව අයුක්තියට
එරෙහිව වංචාවට
එරෙහිව පීඩනයට
අත්තනෝමතිකත්වයට එරෙහිව
ගසන්නට කැරලි
අයිතිය මිනිසා සතු
කියාපාන්නට උරුමය ලේවල
පෙන්වා දෙන්නට
දායාදය පරම්පරාගත රකින්නට
සිටින්නෙමි මෙහි''

එය හිස්කබලේ ආමන්ත්‍රණයයි. එයින් ගම්‍ය වන යථාර්ථය නම් කැප්පෙටිපොළ වැනි විරුවන් මේ මිහිමඬලේ මානව සංහතිය පවත්නාතාක් කල්, ඔවුනගේ වීර වික්‍රමාන්විත අරගල භූමිවල සදා ජීවමාන වන බවයි. ඔවුනගේ ස්වරය, හඬ, සදාතනිකය. කවර රටක, කුමන කාලයක පැනනගින විමුක්ති අරගලයකට වුව ද ජීවගුණය සපයනු ඇත.

මහනුවර මගුල් මඩුවට උත්සවශ්‍රීයක් එක්ව තිබුණ ද එය ලක් මැණියන්ගේ නිදහසේ, අභිමානයේ, ස්වාධීනත්වයේ අවමංගල්‍ය සභාවයි. එනම් ''උඩරට ගිවිසුම'' අත්සන් කිරීමට ඉංග්‍රීසි ප්‍රධානීන් සහ සිංහල රදළ නායකයින් සූදානම්ව සිටින නිමේෂයයි. ගිවිසුම අත්සන් කිරීමටත් ප්‍රථම බ්‍රිතාන්‍ය නිලධරුවෙක් විසින් ඉංග්‍රීසි කතිර කොඩිය ඔසවන ලදී. මෙය දුටු වාරියපොල සුමංගල නාහිමිපාණෝ දේශවාත්සල්‍යයෙන්, ජාතිමාමකත්වයෙන් ඔද වැඩී ඉදිරියට පැමිණ ''තොපිට තොපගේ කොඩිය දන්ම මෙහි ඔසවන්න ඉඩ නැහැ'' යනුවෙන් පවසා කතිර කොඩිය බිමට ඇද පාගා සිංහල ධජය ඉහළට ඔසවන ලදහ. ඒ අභීත නැගී සිටීමෙන් සුළු වේලාවකට පසුව උඩරට ගිවිසුම අත්සන් කොට, නිල වශයෙන් ශ්‍රී ලංකාද්වීපය, උඩරට ඇතුළු මුළු රටම ඉංග්‍රීසින්ට යටත් විජිතයක් ලෙස පාවා දෙන ලද්දේය. එබැවින් ගිවිසුම ආශ්‍රිත ජනශ්‍රැති අතර වාරියපොල ශ්‍රී සුමංගල හිමි නාමය ජන හදවත්හි සදා ගෞරවණීය, පූජනීය චරිතයක් බවට පත්ව ඇත.

වික්‍රමසිංහ ප්‍රශස්තියක් ලෙස රචනා කර ඇති ඉංග්‍රීසි හටනේ කවි 308කින් පමණ රජු වර්ණනා කරන අතර ඔහුගේ බල පරාක්‍රමයත්, ඉංග්‍රීසි පාලනය බිඳ හෙළීමට ඔහු සතු ශක්‍යතාවත් ප්‍රකට කරයි. එසේම රජු විසින් කරන ලද, ආගමික හා සමාජමය සේවාවත් පිළිබඳව ද දක්වා ඇත. ඔහුගේ යුද්ධා උපායික ඥාණය අනුව, සතර කෝරළයේ ලෙව්කේ සේනාධිපති මෙන්ම ඉංග්‍රීසීන් ද නොරුස්නා තත්ත්වයට පත් කර රජු නෙරපා දැමීමට අවශ්‍ය මූලිකම ලියවිල්ල ලෙස උඩරට ගිවිසුම සකස් කළ බව සිතිය හැකිය. මෙය ''නෙරපූ රජ'' කෘතිය මගින් ගණනාථ ඔබේසේකර හේතු සහිතව පැහැදිලි කර ඇත. මෙය ඉතිහාසය පුරාම දීර්ඝ කාලීන සැලැස්මක් ලෙස ක්‍රියාත්මක වූවකි.

''කිව්වරන් දද නලගණන් සිට කරන ආසිරි මංගලම්
දුරලමින් නෙක විරිදු දුදනන් සුදණ යුත් ජය මංගලම්
ලොව උතුම් රඟ පවතිනා නිරිඳුට මෙහැම වේවා මංගලම්
සිරි වික්‍රුන් රජසිංහ නිරිඳුට මෙහැම වේවා මංගලම්''

එබැවින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු චරිතයක් ලෙස පරිහානියට අවශ්‍ය කරුණු සංවිධානාත්මකව හා උපක්‍රමශීලීව පෙළ ගැස්වීමත්, ඔහුගේ පාලනයේ සාධනීයතාවන් වෙනුවට නිශේධනාත්මක දුර්ගුණ මතුකර ඒවායෙන් ජනමතය සැකසීමට හැරීමත් නිසා මෙරට රාජවංශය විනාශ කිරීමටත් උත්සුක වූ බව ප්‍රකටවේ. එය ''උඩරට ගිවිසුම'' මගින් වක්‍රාකාරව ප්‍රකාශවන යථාර්ථයයි. ඉංග්‍රීසි හටන වැනි දීර්ඝ ප්‍රශස්ති කාව්‍යයකින් මතුකෙරෙන්නේ මෙසේ හිතාමතාම සඟවා ඇති සත්‍යයේ පැතිකඩකි.

එසේම ඇහැලේපොළ මහ නිළමේ, කිවුලේගෙදර, බූටාවේ රාල ආදීන් පිළිබඳව ද ජනශ්‍රැතියේ ඇත්තේ වීරාභිවාදන පිළිගැනීමකි. ඔවුනගේ සටන්කාමීත්වය,

දේශවාත්සල්‍ය මහත් අභිරුචියෙන් වර්ණනා කර තිබේ. සාමාන්‍යයෙන් මිහිමත උපන් මිනිසකුගේ උපරිම ආයුකාලය වසර සියයක් පමණ විය හැකිය. එම කාල පරිච්ඡේදය තුළ යම් මනුෂ්‍යයෙක් තම ජීවිතය ස්වාර්ථ සාධනය හෝ පරාර්ථ සාධනය පිණිස යොදාගත හැකිය. ස්වකීය ජීවිතය කෑමෙන්, බීමෙන්, ඇඳුමෙන්, පැළඳුමෙන් අනෙකුත් කාමභෝගීය අවශ්‍යතා වෙනුවෙන් කැප කර යෙහෙන් ජීවත් වී අවසානය කරා ලඟාවිය හැකිය. එය සෑම මිනිසෙකුගේම ජීවන පරමාර්ථ අතර පවතින්නකි. එමෙන්ම ඇතමෙක් ස්වකීය ආත්මීය සුඛ විහරණය පසෙකලා පරාර්ථකාමීව පොදු සමාජීය අවැසිතා වෙනුවෙන්, අනෙකාගේ ජීවිත යහපත වෙනුවෙන් තම ජීවිතය පරදුවට තබා කටයුතු කරනු ලබති. කැප්පෙටිපොළ මොනරවිල ඇතුළු මෙකී විරුවන් මිහිමත උදාර, ශ්‍රේෂ්ඨ, පරමාදර්ශී, වීරෝදාර මිනිසුන් ලෙස සදා සම්භාවනාවට පාත්‍රවන්නෝ ය. ඔවුන් ලාංකේය ජන හදවත්වල අමරණීයත්වයට පත්ව තිබෙන්නේ එහෙයිනි.

---

nandana.millagala58@gmail.com